# <u>තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව</u>

අසිත අබේගුණවර්ධන,
අංක 42, මුදියන්සේගේවත්ත,
අලුත් පාර,
දික්වැල්ල.

**<u>අභියාචක</u>**

**අභියාචනා අංකය :**
**RTIC Appeal No 658/2022**

එදිරිව

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - දික්වැල්ල.

**<u>පොදු අධිකාරිය</u>**

**ඉදිරිපිටදී** : 1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්
3. මොහොමඩ් නහියා - කොමසාරිස්

**පෙනී සිටීම** : අභියාචක සිටී.
පොදු අධිකාරිය වෙනුවෙන් සූම් තාක්ෂණය ඔස්සේ පරිපාලන නිලධාරි සචිත් චින්තක මයා / තොරතුරු නිලධාරි සම්බන්ධ වේ.

**ලිඛිත සැළකිරීම්** : අභියාචක - 2022.08.22
පොදු අධිකාරිය - ඉදිරිපත් කර නොමැත.

**විභාග කළ දිනය** : 2022.10.13

**තීරණය කළ දිනය** : 2022.10.13

**<u>කොමිෂන් සභාවේ තීරණය :</u>**

**අභියාචනයට පසුබිම්වූ කරුණු**

අභියාචක විසින් 2021.03.26 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා ඇත.

> *"2020.11.27 දිනැති මාගේ ඉල්ලීමට අදාලව ගෙන ඇති පියවර කුමක්ද යන්න? යොමු කිරීමක් කලේ නම් ඊට අදාල ලිපියේ පිටපතක්"*

මීට ප්‍රතිචාර ලෙස තොරතුරු නිලධාරි 2021.03.31 වන දිනැතිව සඳහන් කර සිටින ලද්දේ,

> *"………. එම කරුණට අදාලව විධිමත් පරීක්ෂණයක් සිදුකර ඉදිරි පියවර ගැනීම සඳහා මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විමර්ශන අංශය වෙත යොමු කර ඇති බව දන්වා සිටිමි."*

මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක විසින් 2021.12.31 දිනැතිව නම්කළ නිලධාරි වෙත අභියාචන යොමු කර ඇත. නම්කළ නිලධාරි පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2022.03.22 දිනැතිව කොමිෂන් සභාව වෙත මෙම අභියාචනය යොමු කර ඇත.

අභියාචකගේ 2021.12.31 දිනැති අභියාචනයට ප්‍රතිචාර දැක්වීමට පොදු අධිකාරිය අපොහොසත් වී ඇති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත. ඒ අනුව, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි විධිවිධානවලට අනුකූලව, පනත මගින් නිශ්චිතව දක්වා ඇති කාල නියමයන් තුළ පුරවැසියන් විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා ප්‍රතිචාර දැක්වීමට, පනතෙහි 31(2) සහ 31(3) වගන්ති ප්‍රකාරව නම්කළ නිලධාරියා හට පැවරී ඇති ව්‍යවස්ථාපිත වගකීම පොදු අධිකාරියේ නම්කළ නිළධාරියා විසින් පැහැර හැර ඇති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර ඇත.

අභියාචක විසින්, පොදු අධිකාරියට පිටපත් සහිතව, 2022.08.22 දිනැතිව කොමිෂන් සභාව වෙත ලිපියක් ඉදිරිපත් කරමින් වෙනත් කරුණු අතර මෙසේ ප්‍රකාශ කර ඇත.

*"උක්ත සඳහන් තොරතුරු ඉල්ලීම සම්බන්ධයෙන් මෙතෙක් තොරතුරු ලබා දී නොමැති බවයි."*

## සලකා බැලීම

ඉහත සඳහන් තොරතුරු ඉල්ලීමට අදාළව එහි පළමු වන කොටසට අදාළ තොරතුරු පොදු අධිකාරිය විසින් 2022.03.31 දිනැති ලිපියෙන් මුදා හැර ඇති බවට පොදු අධිකාරිය අද දින පරීක්ෂණයේදී සඳහන් කරන ලදී. ඊට අදාළව යවන ලද ලිපිය ඉදිරිපත් කරන ලෙසට පොදු අධිකාරියට නියම කරනු ලැබූ අතර ඒ අනුව පොදු අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද්දේ එම තොරතුරු ඉල්ලීමට අදාළව යවන ලද ලිපියක් නොව අභියාචක විසින් පොදු අධිකාරිය වෙත වෙනත් කරුණක් සඳහා යවන ලද ලිපියක් වෙනුවෙන් යවන ලද ලිපියකි. මේ අනුව පොදු අධිකාරිය නොමග යවනසුලු තොරතුරු ලබා දී ඇති බව පැහැදිලි වේ.

එබැවින් පොදු අධිකාරිය විසින් උක්ත තොරතුරු ඉල්ලීමට අදාළව තොරතුරු සැපයීමට අසමත් වී ඇති බව පැහැදිලිය. ඒ අනුව 2022.10.22 දිනට ප්‍රථම, ඉහත සඳහන් තොරතුරු ඉල්ලීමේ අන්තර්ගත සියලුම තොරතුරු සහ ඊට අදාළ ලේඛන වල සහතික පිටපත්, කොමිෂන් සභාවටද පිටපත් සහිතව අභියාචක වෙත මුදා හැරීමට පොදු අධිකාරිය ක්‍රියා කළ යුතු බවට තීරණය කරමු.

එසේ තොරතුරු ලබා දීමට පොදු අධිකාරිය අපොහොසත් වන්නේ නම් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරියට සහ තොරතුරු නිලධාරිට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය යුතු බවටද වැඩිදුරටත් තීරණය කරමු.

මෙම තීරණය පොදු අධිකාරිය, තොරතුරු නිලධාරි සහ අභියාචක වෙත දැනුම් දීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

අභියාචනය අවසන් කරන ලදී.